# විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
## வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு
## MINISTRY OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM

**මාධ්‍ය නිවේදනය**

**විදේශ අමාත්‍ය විජිත හේරත් ආර්ථික හා දේශපාලන සබඳතා ශක්තිමත් කිරීම සඳහා ජර්මනියේ සංචාරයක**

ජර්මානු-ආසියා පැසිෆික් ව්‍යාපාරික සංගමයේ ජර්මනියේ (OAV) බ්‍රෙමන් ශාඛාව විසින් කරන ලද ආරාධනාවකට අනුව, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය විජිත හේරත් මහතා, වෙළෙඳාම සහ විදේශ රැකියා සම්බන්ධ රැස්වීම් මාලාවකට සහභාගී වීම සඳහා 2026 පෙබරවාරි 26-27 වැනි දිනවල ජර්මනියේ සංචාරයක නිරත වීමට නියමිතය.

ආසියා පැසිෆික් ව්‍යාපාරික සංගමයේ බ්‍රෙමන් ශාඛාවේ 125 වැනි සංවත්සරයට අදාළ උත්සව සඳහා අමාත්‍යවරයා ආසියාවේ සම්භාවනීය ආරාධිත අමුත්තා සහ ප්‍රධාන කථිකයා ලෙස සහභාගී වන අතර ජර්මානු පාර්ශවයේ සම්භාවනීය ආරාධිත අමුත්තා සහ ප්‍රධාන කථිකයා ලෙස ජර්මනියේ විදේශ අමාත්‍ය ආචාර්ය ජොහාන් වාඩෙෆුල් සහභාගී වනු ඇත. OAV යනු ජර්මානු-ආසියානු ව්‍යාපාරික සබඳතා ප්‍රවර්ධනය කිරීම සඳහා වන විශාලතම ජර්මානු සංගමය වන අතර එය ආසියා පැසිෆික් කලාපයේ ජර්මානු ව්‍යාපාරික නායකයින් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් සම්බන්ධ කරයි.

මෙම සංචාරයේදී අමාත්‍ය හේරත් මහතා අමාත්‍ය වාඩෙෆුල් මහතා සමඟ සාකච්ඡා පැවැත්වීමටත්, ශ්‍රී ලංකාව පිළිබඳ ව්‍යාපාරික වටමේස සාකච්ඡාවකට සහභාගී වීමටත් නියමිතය.

**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය**

**කොළඹ**

**2026 පෙබරවාරි 25 වැනි දින**

Foreign Affairs
විදේශ කටයුතු
வெளிநாட்டு அலுவல்கள்
Republic Building, Colombo 1
ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1
குடியரசுக் கட்டிடம், கொழும்பு 1
☎ 2 325 373/5, 2 207 200/7
✉ cypher@mfa.gov.lk

Foreign Employment
විදේශ රැකියා
வெளிநாட்டு வேலைவாய்ப்பு
17th Floor, "Mehewara Piyesa", Narahenpita, Colombo 5
17 වන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 5
17 அவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 5
☎ 2 331 200
✉ info@mfe.gov.lk

Tourism
සංචාරක
சுற்றுலாத்துறை
No 03, Times Building, Bristol Street (Sir Razik Fareed Mw), Colombo 1
අංක 03, ටයිම්ස් ගොඩනැගිල්ල, බ්‍රිස්ටල් වීදිය (සර් රාසික් ෆරීඩ් මාවත), කොළඹ 1
இல.03, டைம்ஸ் கட்டிடம், பிரிஸ்டல் தெரு (சர் ராசிக் ஃபரீத் மாவத்தை), கொழும்பு 1
☎ 2 381 798, 2 321 222
✉ secretary@tourismmin.gov.lk